# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2026 අංක 10 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 2026 අප්‍රේල් මස 09 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---

**2026 අප්‍රේල් මස 10 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී**

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : රු. 20.00 තැපැල් ගාස්තුව : රු. 150.00

මෙම පනත www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# 2026 අංක 10 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2026 අප්‍රේල් මස 09 වන දින]

එල්. ඩී.- ඕ. 73/2025

## 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

**1.** මේ පනත 2026 අංක 10 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2022 අංක 25 දරන සමාජ ආරක්ෂණ දායකත්ව බදු පනතේ 4 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- 2022 අංක 25 දරන පනතේ 4 වන වගන්තිය සංශෝධනය කිරීම

(1) එහි (ඇ) ඡේදයේ "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් වෙනුවට, "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සහ 2026 ජූලි මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, යම් කාර්තුවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන නවයක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට හෝ අනුයාත කාර්තු හතරක කාලසීමාවක් සඳහා සමස්ත පිරිවැටුම රුපියල් මිලියන තිස්හයක් ඉක්මවන හෝ ඉක්මවීමට ඉඩ ඇත්තා වූ දිනයේ සිට දින පහළොවකට වඩා පසු නොවී,"; සහ

PL 15708 - 768 (2026/03)

(3) එහි (ඇ) ඡේදයේ අතුරු විධානයේ "මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට" යන වචන සහ "සලකනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට, පිළිවෙළින් "2024 මාර්තු මස 20 වන දින සිට" යන වචන සහ ඉලක්කම් සහ "සලකනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම

**3.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ආ) ඡේදයේ "රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී; හෝ" යන වචන වෙනුවට, "රුපියල් මිලියන එකසිය විස්සක් නොඉක්මවන අවස්ථාවක දී;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (ඇ) ඡේදයේ "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු" යන වචන සහ ඉලක්කම් සහ "රුපියල් මිලියන හැටක් නොඉක්මවන අවස්ථාවක දී," යන වචන වෙනුවට, පිළිවෙළින් "2024 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු සහ 2026 ජූලි මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් සහ "රුපියල් මිලියන හැටක් නොඉක්මවන අවස්ථාවක දී; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) එහි (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඈ) ඒ තැනැත්තාගේ සමස්ත පිරිවැටුම 2026 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් කාලසීමාවක් සඳහා, අනුයාත කාර්තු හතරක කාලසීමාවක් සඳහා රුපියල් මිලියන තිස්හයක් නොඉක්මවන අවස්ථාවක දී,".

**4**. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:- ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය සංශෝධනය කිරීම

(1) එහි Iඅ කොටසෙහි 25 වන අයිතමයෙහි "ආනයනය කරනු ලබන" යන වචන වෙනුවට, "2026 මැයි මස 1 වන දිනට පෙරාතුව ආනයනය කරනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි Iආ කොටසෙහි -

(අ) 5 වන අයිතමයෙහි "එල්. පී. ගෑස්; සහ" යන වචන වෙනුවට, "එල්. පී. ගෑස්;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) 6 වන අයිතමයෙහි "(රබර් කිරි, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්)." යන වචන වෙනුවට, "(රබර් කිරි, ක්‍රේප් රබර් හෝ රබර් ෂීට්); සහ"; සහ

(ඇ) 6 වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"7. 2026 මැයි මස 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, යම් මෝටර් වාහනයක්.".

**5.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය. අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව

පාර්ලිමේන්තුවේ සිංහල පනත්, අංක 118, දොස්තර ඩැනිස්ටර් ද සිල්වා මාවත, කොළඹ 08,
රජයේ මුද්‍රණාලයේ පිහිටි ''ප්‍රකාශන පියස'' හි දී මිල දී ගත හැක.